# වවුනියාව දකුණ සිංහල ප්‍රාදේශීය සභාව

## රියදුරු III ශ්‍රේණියේ තනතුර සඳහා
## පවතින පුරප්පාඩුව විවෘත පදනම මත පිරවීම සඳහා
## අයදුම්පත කැඳවීම - 2026

නියෝජ්‍ය ප්‍රධාන ලේකම්.- පිරිස් හා පුහුණු උතුරු පළාත විසින් එවන ලද අංක NP/17/P&T/04/Cadre/21(Vol-V) හා 2026.10.01 වන දිනැති ලිපිය හා පළාත් පාලන කොමසාරිස්ගේ අංක NP/14/1/ET/Uns/Gen/2026 හා 2026.10.05 වන දිනැති ලිපිය අනුව රියදුරු තනතුරෙහි පවතින පුරප්පාඩු 04 පිරවීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමතිය ලැබී ඇති බවට දන්වා ඇති බැවින් ද. 2013.01.01 වන දින සිට ක්‍රියාත්මකවන පරිදි, උතුරු පළාත ගරු ආණ්ඩුකාර තුමා විසින් අනුමත කරන ලද උතුරු පළාත් පාලන දෙපාර්තමේන්තුවේ රියදුරු සේවයට අදාළ සේවා කොන්දේසි හා එහි සංශෝධනවලට අනුකූලව වවුනියාව දකුණ සිංහල ප්‍රාදේශීය සභාවේ පවතින පහත සඳහන් තනතුරුවලට අදාළ පුරප්පාඩු පිරවීම සඳහා වවුනියාව දකුණ සිංහල ප්‍රාදේශීය සභාවේ පරිපාලනය ප්‍රදේශය තුළ ස්ථිර වශයෙන් පදිංචිව සිටින අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| තනතුරේ නම | ශ්‍රේණිය | ඇබෑර්තු සංඛ්‍යාව |
|---|---|---|
| රියදුරු | III | 04 |

01. සාමාන්‍ය සුදුසුකම් :-

I. අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

II. මනා පෞරුෂයක්. යහපත් හැසිරීමක් හා හොඳ ශරීර සෞඛ්‍ය තත්වයකින් හෙබි යහපත් පුද්ගලයෙකු විය යුතුය.

III. අයදුම්කරු වවුනියාව දකුණ සිංහල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වසර 05 ක ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය. (ග්‍රාම නිලධාරියා විසින් නිකුත් කරන ලද පදිංචි සහතිකයක් හෝ ඡන්ද දායක ලියාපදිංචි සහතිකයක් මඟින් පදිංචිය තහවුරු කළ යුතුය.)

IV. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට වැඩි සහ අවුරුදු 45 ට අඩු විය යුතුය.

02. සේවා කොන්දේසි

ඝන අපද්‍රව්‍ය බැහැරකිරීම, ජල අපද්‍රව්‍ය බැහැරකිරීම, පානීය ජල සැපයුම යන සේවාවන් සහ අනෙකුත් සේවාවන් ඇතුළත්වේ. (Gully Bowser, Garbage Compactor, Tractor, Water Bowser, Three Wheeler, Van, Pick-up)

03 අධ්‍යාපනික හා වෘත්තිය සුදුසුකම් :-

I. අ.පො.ස. (සා/පෙළ) විභාගයේ දී වාර දෙකකට නොවැඩි වාර ගණනක දී අවම වශයෙන් විෂයන් දෙකකින් සම්මාන සාමාර්ථය සහිතව සිංහල භාෂාව සහ ගණිතය ඇතුළුව විෂයන් 06 ක් සමත් වී තිබිය යුතුය. (එක වරකදී විෂයන් 5 ක් සමත්වීම අනිවාර්යවේ.)

II. රියදුරු බලපත්‍රය ලබා වසර 03 ක් ඉක්මවී තිබිය යුතුය. රියදුරු බලපත්‍රයේ වර්ග A, B, B1, C, C1, G ඇතුළත් වී තිබිය යුතුය.

04. වැටුප් පරිමාණය :-

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 අනුව PL3-2025 වැටුප් පරිමාණයට අනුව රියදුරු III ශ්‍රේණියේ තනතුරට අදාළ වැටුප් පරිමාණය රු. 42780-10X490-10X 540-10X590-12X630-66540 වේ.

05. තේරීමේ ක්‍රමය :-

අනුමත කරන ලද සම්මුඛ පරීක්ෂණ කමිටුව විසින් අදාළ තනතුරට නියමිත සේවා සටහන් අනුව සිදුකරනු ලබන සම්මුඛ පරීක්ෂණය ප්‍රකාරව සම්මුඛ පරීක්ෂණය පවත්වා සම්මුඛ පරීක්ෂණයේ දී. ලබා ගන්නා ලකුණු පදනම මත (Rank) තෝරාගන්නා අයට පත්වීම් ප්‍රදානය කරනු ලැබේ.

06. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ ලකුණු ක්‍රමය

| ප්‍රධාන මාතෘකාව | උපරිම ලකුණු | තෝරාගැනීම සඳහා ලබාගත යුතු අඩුම ලකුණු |
|---|---|---|
| අධ්‍යාපන සුදුසුකම් | 50 | 20 |
| රැකියා පිළිබඳ දැනුම | 25 | 10 |
| සන්නිවේදන ආකල්ප | 25 | 10 |
| මුලු | 100 | 40 |

07. අයදුම්කිරීමේ අවසන් දිනය : - 2026-11-16

08. අයදුම් කරන ආකාරය :-

වවුනියාව දකුණ සිංහල ප්‍රාදේශීය සභාවේ 2026.10.26 වන දින සිට 2026.11.16 වන දින දක්වා රියදුරු තනතුරු සඳහා අයදුම්පත් ලබාගත හැක. සම්පූර්ණ කරන ලද අයදුම්පත ලිපි කවරයේ දමා ලිපිකවරයේ ඉහළ වම් කෙළවරේ **රියදුරු තනතුර සඳහා අයදුම්පත,** යනුවෙන් සඳහන් කර අයදුම්පත් ඉදිරිපත් කිරීමේ අවසන් දිනට හෝ ඊට පෙර ලැබිය හැකි පරිදි ලේකම්. වව්නියාව දකුණ සිංහල ප්‍රාදේශීය සභාව, A-09 පාර. ඊරට්පෙරියකුලම්. වවුනියාව යන ලිපිනය වෙත තැපෑලෙන් හෝ ගෙනවිත් භාරදිය හැකිය. අයදුම්පත ඉදිරිපත් කිරීමේ අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත කිසිදු හේතුවක් නිසා හෝ පිළිගනු නොලැබේ.

අයදුම්පතේ නිවැරදි තොරතුරු සැපයිය යුතුය. සම්මුඛ පරීක්ෂණයට පෙර හෝ සම්මුඛ පරීක්ෂණය පවතින අතරතුර, සම්මුඛ හෝ සම්මුඛ පරීක්ෂණයට පසුව හෝ අයදුම්කරු විසින් සපයනු ලබන ඕනෑම තොරතුරක් අසත්‍ය බව ඔප්පුවන ඕනෑම අවස්ථාවක දී ඔහු නුසුදුස්සකු බව හැඟී ගියහොත් සේවයෙන් පහ කිරීමට හැකිය.

**වී.නිශ්ශංක මිය**
**ලේකම්,**
**වවුනියාව දකුණ සිංහල ප්‍රාදේශීය සභාව.**

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED